ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT
"Mihikatha Medura", Land Secretriat, 1200/6, Rajamalwatta Road, Battaramulla.
011 279 740
011 286 405

My No. L2/1/65/චක්‍රලේඛ/2021

Your No

Date 2021.12.30

සියලුම ප්‍රාදේශීය ලේකම්වරු,

**<u>බලපත්‍ර/දීමනාපත්‍ර මගින් බැහැරකර ඇති රජයේ ඉඩම්වල දුරකථන සන්නිවේදන කුළුණු ඉදිකිරීම</u>**

තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන සීඝ්‍ර වර්ධනය හේතුවෙන් දුරස්ථ ප්‍රදේශවල ද දුරකථන සන්නිවේදන කුළුණු ඉදිකිරීමේ ප්‍රවණතාවයක් වර්තමානයේ ශ්‍රී ලංකාවේ දක්නට ලැබේ. ඒ අනුව ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර හෝ දීමනාපත්‍ර ලබා දී ඇති ඉඩම්වල දුරකථන සන්නිවේදන කුළුණු ඉදිකිරීම සඳහා සිදුකරන ඉල්ලීම් ප්‍රමාණය ද සැලකියයුතු ලෙස ඉහළ ගොස් ඇත. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍ර/ දීමනාපත්‍ර ඉඩම්, වාණිජ පරමාර්ථයෙන් යුතු කාර්යයක් සඳහා යෙදවීම නීත්‍යානුකූල නොවන බැවින්, එබැවින් බලපත්‍ර/ දීමනාපත්‍ර ඉඩම්වල දුරකථන සන්නිවේදන කුළුණු ඉදිකිරීමේ දී මෙතෙක් අනුගමනය කරන ලද ක්‍රමවේදය වූයේ දීමනාපත්‍රය/ බලපත්‍රය හෝ ඉන් කොටසක් හිමිකරුගේ කැමැත්තෙන් රජයට භාරගෙන අවලංගුකර, අදාල ඉඩම් කොටස දුරකථන සමාගම වෙත රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝ කාලීන බදු පදනම මත ලබාදීමයි.

02. මෙම ක්‍රමවේදයට අනුව කටයුතු කිරීමේදී දීමනාපත්‍රකරුගේ හෝ බලපත්‍රකරුගේ ඉඩම් අයිතිය සම්පූර්ණයෙන්ම අහිමිවන බැවින්, ඔවුන් විසින් දුරකථන සන්නිවේදන කුළුණු ඉදිකිරීම ප්‍රතික්ෂේප කිරීමත්, නීත්‍යානුකූල නොවන ආකාරයෙන් දීමනාපත්‍රකරුවන්/ බලපත්‍රකරුවන් දුරකථන සමාගම් සමඟ ගිවිසුම් වීමත් පැහැදිලිව දක්නට ලැබේ. එමගින් දුරකථන සමාගම් සිය සන්නිවේදන ජාලය පුළුල් කිරීමට කුළුණු ඉදිකිරීම සඳහා සුදුසු ඉඩම් සොයාගැනීමේ අභියෝගයකට මුහුණ දී ඇති අතර ඉඩම් හිමියන් හා දුරකථන සමාගම් විසින් නීත්‍යානුකූල නොවන ලෙස ගිවිසුම් ගතවීම මගින් දුරකථන සමාගම් නීතිමය ගැටලු වලට මුහුණ දෙන්, රජයට අයවිය යුතු බදු ආදායම් අහිමි වීමත් සිදු වී තිබේ.

03. මෙම හේතුවෙන් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර/ දීමනාපත්‍ර මගින් බැහැරකර ඇති ඉඩම්වල දුරකථන සන්නිවේදන කුළුණු ඉදිකිරීමේදී අනුගමනය කලයුතු ක්‍රියාපටිපාටිය සංශෝධනය කිරීමේ අරමුණින් මෙම උපදෙස් පත්‍රිකාව නිකුත් කරනු ලැබේ.

04. ඒ අනුව, ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත්කර ඇති බලපත්‍ර/ දීමනාපත්‍ර ඉඩමක දුරකථන සන්නිවේදන කුළුණක් ඉදිකිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් වූ විට පහත පරිදි කටයුතු කරන ලෙස මෙමගින් දැනුම් දෙනු ලැබේ.

- I දුරකථන සන්නිවේදන කුළුණ ඉදිකිරීමට යෝජිත ඉඩම, ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍රයක්/ දීමනාපත්‍රයක් මගින් බැහැරකර ඇති ඉඩමක් නම්, බලපත්‍රය/ දීමනාපත්‍රය හෝ ඉන් කොටසක් දීමනාපත්‍රකරුගේ/ බලපත්‍රකරුගේ කැමැත්තෙන් රජයට භාරගෙන අවලංගු කිරීමට කටයුතු කළයුතුය.
- II අදාල ඉඩම දීමනාපත්‍ර සහිත ඉඩමක් නම් මාගේ 2020/02 චක්‍රලේඛයේ VI කොටස අනුව දීමනාපත්‍රය අවලංගු කිරීමට කටයුතු සිදුකල යුතු අතර බලපත්‍රයක් සහිත ඉඩමක් නම් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ 157 වගන්තිය අනුව බලපත්‍රය අවලංගු කිරීමට කටයුතු කලයුතුය. රජයට භාර ගන්නේ බලපත්‍රයේ කොටසක් නම්, ඒ පිළිබඳව බලපත්‍රයේ හා ලෙජරයේ සටහන් යොදා ඉඩම් ප්‍රමාණය සංශෝධනය කිරීමට කටයුතු සිදුකල යුතුය.

Accounts 011 287 3833 011 286 4462
ඉඩම් I / Land I 011 287 4025 011 288 3812
ඉඩම් II / Land II 011 287 5834 011 287 3110
ඉඩම් III / Land III 011 279 748 011 288 363
E-mail - landcom@landcommdept.gov.lk
Web Address - www.lancommdept.gov.lk

III. දීමනාපත්‍රයෙන් කොටසක් සමඟින් එසේම කාර්යාලයන් හා, මුල් දීමනාපත්‍රය අවලංගු කිරීමෙන් අනතුරුව, දුරකථන කුළුණු ඉදිකිරීමට යෝජිත ඉඩම් කොටස හැර ඉතිරි කොටස සඳහා නව විස්තර ලබාගෙන මුල් දීමනාපත්‍රලාභියාට නමින් නව දීමනාපත්‍රය නිකුත් කළ යුතුය

IV. දුරකථන කුළුණු ඉදිකිරීමට යෝජිත ඉඩම් කොටසක් සම්බන්ධයෙන්, අදාළ කාර්යය සඳහා යොදාගත හැකිවන පරිදි බලපත්‍රකරු/ දීමනාපත්‍රකරු වෙත දීර්ඝ කාලීන බදු පදනම මත ලබාදීමට කටයුතු සිදුකළ යුතු අතර එපිදි දීමනාපත්‍රය/ බලපත්‍රය නිකුත්කළ දිනය, බද්ද ආරම්භ වන දිනය ලෙස සලකා ගැනීමට කටයුතු කළ හැකිය.

V. දීර්ඝ කාලීන බදුකරයක් නිකුත් කිරීමෙන් අනතුරුව දීර්ඝ කාලීන බදු ලබාගත් ඉඩමේ දුරකථන සන්නිවේදන කුළුණු ඉදිකර පවත්වාගෙන යාමට හැකිවන පරිදි අංක 2019/02 චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව, ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය මත දුරකථන සන්නිවේදන සමාගම වෙත අනුබදු දීමට අවශ්‍ය ලේඛන සකස්කර පළාත් ඉඩම් කොමසාරිස්/ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් මඟින් මා වෙත එවීමට කටයුතු සිදුකළ යුතුය.

05. මෙම සංශෝධිත ක්‍රමවේදය ප්‍රමාදයකින් තොරව සිදුකිරීම සඳහා ඔබගේ විශේෂ අවධානය යොමුකරන ලෙසත්, දීමනාපත්‍රය අවලංගු කිරීම සඳහා මා වෙත යොමු කිරීමෙන් අනතුරුව බදු නිර්දේශ සැකසීමේ කටයුතු කඩිනමින් ආරම්භකර, එම නිර්දේශ වාර්තා පළාත් ඉඩම් කොමසාරිස්/ ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) මඟින් මා වෙත යොමු කරන ලෙසත් දන්වා සිටිමි.

06. මෙම ක්‍රියාවලියේ සිදුවන අනවශ්‍ය ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා හැකි සෑම විටම ක්‍රියාවලිය ඒකාබද්ධකර සමගාමීව සිදුකිරීම සඳහා අවධානය යොමු කරන ලෙසත් වැඩිදුරටත් දන්වා සිටිමි.

07. මෙම උපදෙස් පත්‍රිකාව අනුව කටයුතු කිරීමේදී යම් ගැටලුවක් වේ නම් මා වෙත යොමු කරන ලෙස දන්වා සිටිමි.

ජී.ඩී කීර්ති ගමගේ
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත :

01. ලේකම්, ඉඩම් අමාත්‍යාංශය
02. සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරු
03. සියලුම අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්වරු/ සහකාර ඉඩම් කොමසාරිස්වරු
04. සභාපති, තොරතුරු සන්නිවේදන නියාමන කොමිසම
05. ප්‍රධාන විධායක නිලධාරී, ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් සමාගම
06. ප්‍රධාන විධායක නිලධාරී, ඩයලොග් ආසියාටා සමාගම
07. ප්‍රධාන විධායක නිලධාරී, හචිසන් ටෙලිකොමියුනිකේෂන්ස් ලංකා (පුද්ගලික) ලිමිටඩ්
08. ප්‍රධාන විධායක නිලධාරී, භාර්ති එයාර්ටෙල් ලංකා (පුද්ගලික) ලිමිටඩ්

} කරු.දැ.ගැ.ස